රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 18/2015(V)

මගේ අංකය : EST-7/03/ALW/2012
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07

2024.06.27

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## රාජ්‍ය සේවයේ විධායක සේවා ගණයේ නිලධරයන්ට විශේෂ දීමනාවක් ලබා දීම

ඉහත කරුණ සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2015.06.26 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2015, 2015.07.13 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2015(I), 2018.02.20 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2015(II), 2019.12.07 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2015(III) සහ 2020.01.07 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2015(IV) කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. 2015.07.13 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2015(I) හි පළමු ඡේදයේ පරිදි සුදුසුකම් ලබන රාජ්‍ය සේවයේ විධායක සේවා ගණයේ නිලධරයන්ට මෙතෙක් සේවා කාලය මත පදනම්ව ගෙවන ලද විශේෂ දීමනාව වෙනුවට සේවා කාලය නොසලකා රු.25,000/- ක විශේෂ මාසික දීමනාවක් ගෙවීමට 2024.06.24 දින පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කර ඇත. මෙම දීමනාව ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ, ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ සහ ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයේ නිලධරයන්ට ද හිමිවේ.

03. තවද, 2015.06.26 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2015 නිකුත් කිරීමෙන් පසුව එම චක්‍රලේඛය සහ එයට ආනුෂංගිකව නිකුත් කළ චක්‍රලේඛවල හිමිකම සමඟ එයට අතිරේකව සේවාවෙහි/තනතුරෙහි සුවිශේෂිතාව සැළකිල්ලට ගෙන, විශේෂ දීමනා අනුමත කළ සේවාවලට/තනතුරුවලට අයත් නිලධරයන්ට මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක වන දිනට අදාල විධිවිධාන අනුව හිමි වන දීමනාව/දීමනා රු.25,000/- ට වඩා අඩු නම්, ඔවුනට එම දිමනාව/දීමනා සහ මෙම චක්‍රලේඛය මඟින් හිමි වන රු.25,000/- අතර වෙනස පමණක් ගෙවිය යුතු වන අතර, එම දීමනාව/දීමනා රු.25,000/- ට සමාන හෝ ඊට වඩා වැඩි වන්නේ නම්, එම දීමනාව/දීමනා මෙම චක්‍රලේඛයට අනුව සංශෝධනය නොකළ යුතුය.

04. ඒ අනුව, 2020.01.07 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2015(IV) මඟින් තාවකාලිකව අත්හිටුවන ලද අංක 18/2015(III) දරන 2019.12.07 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය 2024.06.30 දින සිට අවලංගු කෙරෙන අතර, 2011.12.12 දිනැති අංක 28/2011 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ නිලධරයන්ට, 2013.11.12 දිනැති අංක 23/2013 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ නිලධරයන්ට මෙන්ම අමප/13/1466/533/016 හා 2013.10.31 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී එළඹි අංක 41.07 තීරණය අනුව ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයේ නිලධරයන්ට එකී විධිවිධාන අනුව ගෙවනු ලබන දීමනා 2024.07.01 දින සිට ගෙවනු නොලැබේ.

05. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟතාව ඇතිව නිකුත් කරන අතර, මෙම චක්‍රලේඛ විධිවිධාන 2024.07.01 දින සිට ක්‍රියාත්මක වේ.


ප්‍රදීප් යසරත්න
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

දුරකථන : 011-2697233
ෆැක්ස් : 011-2692158
විද්‍යුත් තැපැල : ade-vii@pubad.gov.lk